# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,193—1960 සැප්තැම්බර් 2 වැනි සිකුරාදා—1960.9.2**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 179 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 179 | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 180 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී—බී. 147/46

ඇල්. ජී. ඩී.—ජී. ඒ. 15

### නිවාස හා නගර සංවර්ධන පනත

1946 අංක 57 දරණ පළාත් පාලන පනතේ 5 වැනි වගන්තියෙන් සංශෝධිත, නිවාස හා නගර සංවර්ධන පනතේ (199 වැනි පරිච්ඡේදය) 2 වැනි වගන්තිය යටතේ ගරු පළාත් පාලන හා නිවාස ඇමැතිතුමා විසින් පණවනු ලබන නියෝගය.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමැති.

1960 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹදීය.

**නියෝගය**

පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන ගම් ප්‍රදේශයන් ඇතුළත නිවාස හා නගර සංවර්ධන පනත් ක්‍රියාත්මක කිරීමේ බලතල, 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට එම ගම් ප්‍රදේශයන්ට අදාල ගම් කාර්‍ය සභාවන්ට පැවරෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

පිල්පොල, මැදගම්පත්තු, සිත්තරම්පලාත, කුඹල්වෙල.

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවයේ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ විභාගය (සිංහල)—60.2.27

පළාත් පාලන සේවයේ ටයිප් ගසන්නන්ගේ (සිංහල) සේවයේ තනතුරුවලට පත්වීම් දීම සඳහා, ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ :—

"ඒ" ප්‍රදේශය—

1. අගලවත්ත, වයි. ආර්., දෙදියවල, වස්කඩුව.
2. අමරපාල, ආර්. ඒ., අළුත්ගෙදර, මඩිහ, කඹුරුගමුව.
3. ඇල්ෆ්‍රඩ් රොද්‍රිගු, වී. ජේ., "මේෆයාර්", වැලිගම්පිටිය, ජාඇල.
4. ඉන්ද්‍රවතී (මහත්මිය), ජී. ජී., "සුලලිත", අළුත් පාර, අම්බලන්ගොඩ.
5. ඩැනිස්ටර්, ඇල්., 23/99, මැගසින් පාර, කොළඹ 8.
6. පෙරේරා, එච්. ඩී. ටී., "සිරි නිවස", පින්තාලිය පාර, කඩවත.
7. සුගතදාස, පී., පොල්දුව, ධර්ගා නගරය.
8. සෝමපාල, ඩබ්ලිව්. ඒ., තැ. පෙ. 577, කොළඹ.

"බී" ප්‍රදේශය—

9. කරුණාරත්න, ඒ., මාදෙයියාව, කෑගල්ල.
10. ගුණවර්ධන, ඇම්. ඒ., 506, "සඳ සිරි", පන්නල.
11. සුමනපාල, අයි. ඩී., "සමරසිරි නිවස", හිඟුරක්ගල, හිඟුරක්ගොඩ.

2. අපේක්ෂකයින්ට වහාම පත්වීම් දීමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පළාත් පාලන සේවයේ ඇබෑර්තු ඇති වන පරිදි ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

අණ පරිදි,

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 අගෝස්තු 19 වැනි දා,
තැ. පෙ. 530, කොළඹ.

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී 89/45.

ඇල්.ජී.ඩී.—ජී.එච්.11/12.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාතේ කඳුකර ඉහළ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශණයෙන් සංශෝධිත, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේදී ය.

### අතුරු ව්‍යවස්ථා

කාරක සභාව විසින් සම්මත කර ගන්නා ලද ජල සම්පාදන සේවය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා, එහි 27 වැනි අතුරු ව්‍යවස්ථාව එක්කම ඊළඟට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව යෙදීමෙන් මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ.

"27 ඒ. කාරක සභාව විසින් පිහිටුවන ලද ජල සම්පාදන සේවයෙන් පෞද්ගලික ජල සේවයක් සම්බන්ධ කරන කිසියම් ස්ථානයක අයිති කරුවා විසින් හෝ පදිංචි කරුවා විසින් හෝ තමා වෙත විධිමත් පරිදි නිකුත් කරනු ලබන දැන්වීමක් අනුව, එකී ජල සම්පාදන සේවයෙන් ජලය ලබා ගන්නා සෑම මාසයක් සම්බන්ධයෙන්ම එකී ස්ථානයේ සවි කරන ලද එක් එක් කරාමයක් සඳහා රුපියල් එක බැගින් වූ ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ "කාර්ය සභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාතේ කඳුකර ඉහළ ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ **ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට ලැබෙන සේ **එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.